## බදුල්ල මහා නගර සභාව
## බදුල්ල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 01 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 ගනුදෙනු හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම.

### 1.2.1 පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 මැයි 27 දින වන විට විගණන විමසුම් 12 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 ආදායම් පරිපාලනය

### 2.1.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 17,838 | 20,059 | 35,598 |
| (ii) | බදු කුලී | 22,812 | 25,850 | 14,939 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,710 | 6,594 | 115 |
| (iv) | වෙනත් ආදායම් | 21,678 | 15,997 | 5,680 |

### 2.1.2 බදු කුලී

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක: 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර සඳහා මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන සේවයේ තක්සේරුකරුවෙකු මගින් තක්සේරු කළ යුතු වුවද සභාව සතු කඩ කාමර 503 ක් සඳහා සභා තීරණ මත මාසිකව රු. 430,257 ක බදු කුලී අයකරමින් පැවතිනි.

(ii) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක: 1980/46 දරන චක්‍රලේඛයට පටහැනිව බදුල්ල වෙලේ කඩේ නව වෙළඳ සංකීර්ණයේ බිම්මහලේ කඩ කාමර 04 ක් බදුගත් බදුකරුවන් විසින් එම කඩ කාමර මහජන බැංකුව වෙත අතුරු බදුදී තිබුණි.

(iii) බදුකරුවන් සමඟ එළඹී ගිවිසුම්වල සඳහන් බදු කුලියට වඩා අඩු මාසික කුලී අයකිරීම හේතුවෙන් ගිවිසුම්ගත දිනවල සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා රු.3,432,000 ක ආදායමක් සභාවට අහිමිව තිබුණි.

(iv) මධ්‍යම නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහලෙ කඩ කාමරවල බදු ගිවිසුම ප්‍රකාරව රු.39,000 ක් වන මාසික බදු කුලිය වසර 5 කට වරක් සියයට 10 කින් වැඩි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2010 ජුනි සිට 2011 දෙසැම්බර් දක්වා කාලය තුල සභාවට රු.70,200 ක ආදායමක් අහිමිවී තිබුණි.

### 2.1.3 පොදු වැසිකිලි බදුදීම

සභාවට අයත් පොදු වැසිකිලි 03 ක් සමාලෝචිත වර්ෂය සඳහා බදුදීමේ දී, 2011 වර්ෂයේ බද දුන් බදු මුදලටත් වඩා අඩු වටිනාකමකට අවම ලංසුව තීරණය කිරීම හේතුවෙන් සභා අරමුදලට අවම වශයෙන් රු.1,217,350 ක මූල්‍ය පාඩුවක් සිදුව තිබුණි.

### 2.1.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු. 1,028,716 ක් හා මුද්දර ගාස්තු රු.3,148,350 ක් ලැබිය යුතුව තිබුණි.

**2.1.5** **වෙනත් ආදායම්**

මහා නගර සභා ආඥා පනතේ 247(අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2005 අංක 38 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරන සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය මගින් අනුමත කර ඇති හෝටල් / ලැගුම්හල්වලින් ඒවායේ අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 ක ගාස්තුවක් අයකර ගැනීමට සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා තිබුන නමුත් සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන එවැනි හෝටල් / ලැගුම්හල් **05** කින් රු.5,000 බැගින් වූ වාර්ෂික ගාස්තුවක් පමණක් අයකරගෙන තිබුණි.

2.2 **ආර්ථික නොවූ ගනුදෙනු**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය අනුග්‍රහය යටතේ රු.49,581,503 ක් වැයකර නාගරික ක්‍රීඩාංගණයට යාබද ස්ථානයක ඉදිකර පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය, මහා නගර සභා ක්‍රීඩාංගනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉඩපහසුකම් ලබාගැනීම සඳහා එම ස්ථානයෙන් ඉවත් කිරීමට 2011 නොවැම්බර් 14 දින පැවැති සෞඛ්‍යාරක්ෂක, වෙළඳසැල් හා කුලී පිළිබඳ කාරක සභාවේදී කළ නිර්දේශය 2011 නොවැම්බර් 30 දිනැති මහා සභාවේ දී අනුමත කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2010 මාර්තු 17 දිනැති අංක: 1645/22 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ බදුල්ල නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුව, ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා යෝජිත සංවර්ධන කලාපය තුල ඉහත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ස්ථානගත කර තිබුණි.

2.3 **අවිධිමත් ගනුදෙනු**

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1992 පෙබරවාරි 26 දිනැති අංක: 05/01/119 වෙ ix දරන ලිපිය අනුව කාර්යාල වේලාවෙන් බැහැරව පැය දෙකකට වැඩි කාලයක් කමිටුව පැවැත්විය යුතු සැලසුම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීම හා පිටවීම ඇතුලත් ලේඛණයක් මගින් තහවුරු කර නොගෙන 2010 අගෝස්තු සිට 2012 අගෝස්තු දක්වා පැවැත්වූ සැලසුම් කමිටු 117 ක් වෙනුවෙන් අවස්ථා 37 කදී රු.555,000 ක් ගෙවා තිබුණි.

(ආ) ඇණවුම් කිරීමට පෙර සැපයුම්කරුවන් විසින් ද්‍රව්‍ය සැපයීම හේතුවෙන් 2013 ජනවාරි 30 දින වන විට ගබඩා අංගනයේ රු.143,130 ක් වටිනා අහල් 1 1/2 ගල් කියුබ් 22.02 ක අධි තොගයක් පැවැතුනි.

2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) සභාව විසින් ගෝඝාතකාගාරයක් ඉදිකිරීම සඳහා අදියර 03 ක් යටතේ ග්‍රාම සංවර්ධන සමිති 03 ක් සමඟ රු.4,842,359 ක වටිනා ගිවිසුම්වලට එළඹ තිබූ අතර, ඉදිකිරීම් සම්බන්ධව 2013 ජනවාරි 30 දින කරන ලද පරීක්ෂාවේ දී සතුන් රඳවා තබන ගාල සඳහා සවිකර තිබූ GI බට මීටර් 19.56 ක් ආවරණය වන පරිදි බිත්තියක් බැඳ තිබූ බැවින්, එම GI බට මීටර් 19.56 ක් සඳහා ගෙවන ලද රු.25,135 නිශ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරය පනත අනුව සභාව විසින් ඉදිකරගෙන යනු ලබන ගෝඝාතකාගාරය සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව විසින් 1998 වර්ෂයේ සිට අවස්ථා 50 කදී විවිධ පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු.3,086,261 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි.

(ආ) නගර සභා නිල නිවාස බදු දීම සඳහා වූ බදු ගිවිසුම් ප්‍රකාරව නිලධාරියෙකු ස්ථාන මාරුවී ගොස් මාස 03 ක් ඇතුලත නිල නිවාසය ආපසු භාරදිය යුතුය. නිලධාරීන් තිදෙනෙකු ස්ථාන මාරුවීම් ලබා වසර 03 කට අධික කාලයක් ඉක්මවා ගොස් තිබුන නමුත් නිල නිවාස ආපසු සභාව වෙත භාරදී නොතිබූ අතර, සභාව විසින් නිල නිවාස කුලී ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබූ බැවින්, මෙම නිලධාරීන්ගෙන් කුලී අයකරගත් බවද තහවුරු කරගත නොහැකි විය. තවත් නිලධාරීන් තිදෙනෙකු වසර 05 කට අධික කාලයක් නිල නිවාසවල පදිංචිව සිටින අතර, ඔවුන්ගෙන් සහ ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගෙන් 1971 අංක 3 සහ 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 7 දරන රජයේ නිවාස සන්තකය ආපසු ලබාගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නිල නිවාස සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1980 අංක 46 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව සභාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු අනියම් / ආදේශක සේවකයින් වෙනුවෙන් 2010 ජූලි සිට 2011 ජුනි දක්වා කාලය සඳහා එම අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.42,721 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබුණි.

(ඈ) ඌව පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2005 මාර්තු 24 දිනැති අංක 2/මු/1 දරන ලිපිය හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව මුදල්, මුද්දර, දේපල, ගබඩා ආදියේ භාරකාරත්වය දරන, චෙක්පත් අත්සන් කරන හා වවුචර් සහතික කරන සහ සභාවේ එවැනි වගකීම් දරන නිලධාරීන් 33 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි.

(ඉ) 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුල ගොඩනැගිලි අයදුම්පත් 2654 ක් ලැබී ඉන් 1874 ක් අනුමත කර තිබුන අතර, මහා නගර සභා ආඥා පනතේ 127(අ) වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් තක්සේරු කර තිබුනේ ඉදිකිරීම් 231 ක් සඳහා පමණි.

(ඊ) සභා බල ප්‍රදේශය තුල චිත්‍රපට ප්‍රදර්ශනය කරන සිනමා ශාලාවක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභා අනුමැතිය සහ චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා ප්‍රසිද්ධ රඟදැක්වීම් බලපත්‍රය 2012 අප්‍රේල් වන විටත් ලබාගෙන නොතිබුණි. එම සිනමා ශාලාවේ සහ තවත් සිනමා ශාලාවක සිදුකරන ලද ප්‍රවේශ පත් පරීක්ෂාවක දී සභා නිල මුද්‍රාව රහිතව පොත් 10 ක ප්‍රවේශපත්‍ර අලෙවි කරමින් පැවතිනි.

(උ) සභාවේ ගෝඝාතකාගාරය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන සංශෝධිත පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද අංක: 1159/22 හා 2000 නොවැම්බර් 22 දිනැති

අතිවිශේෂ ගැසට් පත්‍රයේ "අ" උප ලේඛණය ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

## 2.6 කාර්යසාධනය

(අ) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන ලිපියේ (05) (1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් පිළියෙල කර තිබුන සංයුක්ත සැලැස්මට සෞඛ්‍ය සේවා වැඩසටහන් ඇතුලත් කර නොතිබූණි.

(ආ) සභාවේ ක්‍රියාකාර සැලැස්මට අනුකූලව 2012 වර්ෂය සඳහා අයවැය ලේඛණය පිළියෙල කර නොතිබුන අතර, අයවැය ලේඛණයේ ප්‍රතිපාදන සලසා තිබු රු.9,644,800 ක් වටිනා ව්‍යාපෘති 07 ක් ක්‍රියාකාර සැලැස්මට ඇතුලත්ව නොතිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය